# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2252/53 - 2021 නොවැම්බර් මස 06 වැනි සෙනසුරාදා - 2021.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත

බලතල පැවරීමේ නියෝග

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත අනුව 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ 2.(4) වගන්තියෙන් දකුණු පළාත් සභාවේ සමූපකාර විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල, එකී පළාත් සභාව විසුරුවා ඇති හෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඇ. වගන්තියෙන් මා වෙත පැවරී ඇති හෙයින්, එකී බලතල ප්‍රකාරව දකුණු පළාත් ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මම දකුණු පළාතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (රා.ඉ.) ලෙස සහය වීම සඳහා පත්කර ඇත්තාවූ පහත දක්වා ඇති උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් අය වෙත 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ හා ඒ යටතේ පනවා ඇති රීති ප්‍රකාරව සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියලු බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2021 ජූලි මස 07 වැනි දින,
ගාල්ලේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
| --- | --- | --- |
| තිබ්බොටුවා දෙනිය කංකානම්ගේ ආරියවංශ මහතා | 2021.01.19 | සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 42, 43, 44, (44(6) හැර) 45, 46, 48, 49, 50, 52, 53, 54, 58, (58 (2) (අ) හා 58 (5) හැර) 59, 68 හා 72 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල.<br><br>රීති මාලාවේ : 4, 11, 15, 16, (II), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49, (49xii හැර) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.